## ඓතිහාසික අධ්‍යයනයන්හි නව ක්ෂිතිජයක්

ඓතිහාසික දැනුම මිනිස් ජීවිතයේ නොවැළැක්විය හැකි අංගයක් බවට පත්ව ඇත. නූතන ශිෂ්ටාචාරය තුළ මෙය පැහැදිලිවම දැකගත හැකිය. ඓතිහාසික සවිඥානකත්වය නූතන අනන්‍යතා හැඩගැස්වීමෙහිලා දිගින් දිගටම තීරණාත්මක කාර්යයක් ඉටුකරයි. අපට මෙහිදී යොහාන් හවුසින්ඛා නම් ප්‍රකට ඉතිහාසඥයාගේ අදහසක් වන "ඉතිහාසය යනු කිසියම් සංස්කෘතියක් සිය අතීතය පිළිබඳව සවිඥානකවන ආකෘතියයි" යන්න තරමක් වෙනස් කොට, ඉතිහාසය යනු කිසියම් සංස්කෘතියක් සිය අතීතය මෙන්ම වර්තමානය පිළිබඳවද සවිඥානකවන, එමෙන්ම සිය අනාගතය පරිකල්පනය කරන්නාවූ ද ආකෘතියක් ලෙස හැඳින්වීමට පුළුවන. මේ නිසා ඉතිහාසය ඉගැන්වීම හා ඉගෙන ගැනීම එදිනෙදා ජීවිතයට බෙහෙවින් අදාල වේ.

විශේෂිත දැනුම් ශාඛාවක් ලෙස ගත් කල්හි පසුගිය දශක කිහිපය තුළදී විධිමත් ලෙස ඉතිහාස අධ්‍යයනය කිරීම සම්බන්ධයෙන් විශාල වර්ධනයක් සිදුවී ඇත. කොළඹ විශ්වවිද්‍යාලයේ ඉතිහාසය අධ්‍යයනාංශයේ කාර්යභාරය වන්නේ මෙම නව දැනුම අත්පත්කර ගැනීම හා එම දැනුම ඓතිහාසික ගවේෂණයේදී ප්‍රායෝගික ලෙස යොදා ගැනීමයි. එමෙන්ම ඉතිහාස අධ්‍යයනයේ මෙම නව ප්‍රවණතා ඓතිහාසික ගැටලු සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පිරිස්, විශේෂයෙන් **පාසැල් ගුරුවරුන්, රාජ්‍යතාන්ත්‍රික නිලධාරින්, ජනමාධ්‍යවේදීන් සහ පර්යේෂකයන්**, වෙත ගෙන යාමට ද අප අධ්‍යයනාංශය උපරිම උත්සාහය දරයි.

## පාඨමාලාව පිළිබඳ විස්තර

**කාලසීමාව :** වසරයි

**පැවැත්වෙන දිනය :** සෙනසුරාදා

**පාඨමාලා ගාස්තු :** රු.160,000/=

**මාධ්‍යය :** ද්වි භාෂික (සිංහල සහ ඉංග්‍රීසි)

**ආරම්භය :** 2026 ජනවාරි මස

## අයැදුම් කළයුතු ආකාරය

අයැදුම්පත සහ අනෙකුත් විස්තර කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ ඉතිහාස අධ්‍යනාංශයෙන් ලබාගත හැකි ය. නැතහොත් පහත සඳහන් සබැඳියෙන් බාගත හැකි ය (https://arts.cmb.ac.lk/history/). සම්පූර්ණ කරන ලද අයැදුම්පත සහ අයැදුම්කිරීමේ ගාස්තු ගෙවූ වවුචරය ස්කෑන් කොට ඉතිහාස අධ්‍යයනාංශයට ඊමේල් (mahistorycmb@gmail.com) මගින් එවිය යුතුය. එසේම සියලුම අයැදුම්කරුවන් නියමිත පරිදි සම්පූර්ණකරන ලද අයැදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් **2025 ඔක්තෝම්බර් 30** දිනට පෙර පහත ලිපිනයට එවිය යුතුය. ඉතිහාසය අධ්‍යයනාංශය, ශාස්ත්‍ර පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය, අංක 94, කුමාරතුංග මුණිදාස මාවත, කොළඹ 3.

රු. 3000ක් වූ අයැදුම්පත් ගාස්තුව 304141000003 ගිණුම් අංකය භාවිත කොට ඕනෑම මහජන බැංකු ශාඛාවකින් ගෙවිය හැක.

වැඩි විස්තර: 0112055658 / mahistorycmb@gmail.com

# කොළඹ විශ්වවිද්‍යාලය

## ඉතිහාසය අධ්‍යනාංශය

# ඉතිහාසය ශාස්ත්‍රපති උපාධිය

# (Master of History)

# 2025/2026

## (SLQF 9)

## පාඨමාලාවේ අරමුණු

1. ඉතිහාසය විෂයය භාවිතයට අදාල වන නිපුණතා සහ ඉතිහාසයෙහි න්‍යායාත්මක සහ අනුභූතිමය දැනුමෙන් ශාස්ත්‍රපති උපාධි අපේක්ෂකයන් සන්නද්ධ කිරීම හා නව්‍ය පුහුණුවක් ලබා දීම.

2. ඓතිහාසික පර්යේෂණ සිදුකිරීම සඳහා අවශ්‍ය අන්තර් විෂයික පුහුණුව ප්‍රදානය කිරීම.

3. දීර්ඝ රචනා සහ ශාස්ත්‍රපති නිබන්ධන ලිවීම පිළිබඳව අවධාරණය කිරීම තුළින් දැනුම ආදේශනයට ඉඩකඩ සැලසීම.

4. ශාස්ත්‍රීය සැකැස්මක් තුළ ඓතිහාසික දත්ත භාවිතය සඳහා අවැසි නිපුණතා වර්ධනය කිරීම සහ ඩිජිටල්(අංකිත) මූලාශ්‍ර භාවිතය සඳහා ශිෂ්‍යයන් පුහුණු කිරීම .

## ඇතුළත්වීමේ අවම සුදුසුකම්

(අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලද උපාධියක් තිබීම.

(i) අදාළ විෂය ක්ෂේත්‍රයට අර්ග 30ක් (30 credits) අන්තර්ගත වීම;

හෝ

(ii) අදාළ විෂය ක්ෂේත්‍රයට අර්ග 30ක් (30 credits) හෝ ඒ හා සමාන පූර්ව විෂයික අධ්‍යාපනය/ සේවා පළපුරුද්ද තිබීම;

හෝ

(ආ) ඉහත (අ) සඳහන් විෂය ක්ෂේත්‍රයන්ට අදාළ සුදුසුකම් සපුරා තිබීම;

හෝ

(ඇ) උසස් උපාධි කමිටුව, පීඨ මණ්ඩලය සහ සනාතන සභාව විසින් තීරණය කර ඇති පරිදි NVQ මට්ටම 7 සම්පූර්ණ කර තිබීම.

සහ

ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් සහ බඳවාගන්නා සම්මුඛ පරීක්ෂණයට සතුටුදායක ලෙස මුහුණ දීම.

## පාඨමාලා මොඩියුල

- ✓ ඉතිහාසකරණය: සංකල්පීය හා තාක්ෂණික වාද විෂය
- ✓ පර්යේෂණ විධික්‍රම
- ✓ ලෝක ඉතිහාසය පිළිබඳ තෝරාගත් පඨිත
- ✓ ඓතිහාසික ලේඛන පිළිබඳ හැඳින්වීමක්
- ✓ රාජ්‍යතාන්ත්‍රිකත්වයේ ඉතිහාසය
- ✓ ඉතිහාසය ඉගැන්වීම: කුසලතා සහ විධික්‍රම
- ✓ ස්ත්‍රීපුරුෂ සමාජභාවය හා ඉතිහාසය
- ✓ ස්වාධීන අධ්‍යනය (වචන 8000 - 10000)

## දේශක මණ්ඩලය

- මහාචාර්ය නිර්මාල් රංජිත් දේවසිරි
- මහාචාර්ය නිර්මලී විජේගුණවර්ධන
- මහාචාර්ය අනුත්තරාදේවි විද්‍යාලංකාර
- ආචාර්ය දර්ශි තෝරදෙනිය
- නිදේකා නානායක්කාර මිය